13
පාඩම
त्रयोदशः पाठः

# නාම වරනැඟීම - IV

## (අකාරාන්ත නපුංසකලිංග फल ශබ්දය)

### 13.1 ක්‍රියාකාරකම

අකාරාන්ත නපුංසකලිංග फल ශබ්දය වාචෝද්ගත කරමු.

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | फलम् | फले | फलानि |
| सम्बोधन | हे फल | हे फले | हे फलानि |
| द्वितीया | फलम् | फले | फलानि |
| तृतीया | फलेन | फलाभ्याम् | फलैः |
| चतुर्थी | फलाय | फलाभ्याम् | फलेभ्यः |
| पञ्चमी | फलात् | फलाभ्याम् | फलेभ्यः |
| षष्ठी | फलस्य | फलयोः | फलानाम् |
| सप्तमी | फले | फलयोः | फलेषु |

### 13.2 ක්‍රියාකාරකම

පහත සඳහන් වචන වාචෝද්ගත කරන්න. फल ශබ්දය සේ වරනගන්න.

१ कमल - පියුම

२ पर्ण - කොළය

३ वन - වනය

४ पात्र - පාත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ५ | गृह | - | ගෙය | १३ | पुष्प | - | මල |
| ६ | मुख | - | මුහුණ | १४ | कोटर | - | බෙනය |
| ७ | तृण | - | තණකොළ | १५ | धन | - | ධනය |
| ८ | भोजन | - | ආහාර | १६ | कुसुम | - | මල |
| ९ | नगर | - | නුවර | १७ | उदक | - | ජලය |
| १० | वस्त्र | - | වස්ත්‍රය/ඇඳුම | १८ | नेत्र | - | ඇස |
| ११ | चित्र | - | චිත්‍රය | १९ | मित्र | - | මිතුරා |
| १२ | लेखन | - | ලියුම | २० | उद्यान | - | උයන |

## 13.3 ක්‍රියාකාරකම

කණ්ඩායම් දෙකකට බෙදී ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහනක් ලෙස පහත සඳහන් වචනවල විභක්තිය, වචනය සහ තේරුම සොයමු.

| | | | |
|---|---|---|---|
| १ | कमलम् | ११ | कोटरयोः |
| २ | फलानि | १२ | कुसुमेषु |
| ३ | मुखे | १३ | पात्राभ्याम् |
| ४ | गृहात् | १४ | विश्वाय |
| ५ | नगरेषु | १५ | मित्रस्य |
| ६ | पर्णैः | १६ | वस्त्रेषु |
| ७ | गृहाभ्याम् | १७ | उदकात् |
| ८ | वनानाम् | १८ | चित्रेभ्यः |
| ९ | पात्राय | १९ | पर्णानि |
| १० | तृणेभ्यः | २० | हे फल |

## ද්විතීයා විභක්තිය හඳුනාගනිමු.

- **කර්මය** යනු කර්තෘගේ ක්‍රියාවට යටත් වන පදය යි. **කර්තෘ** ප්‍රථමා විභක්තියෙන් යෙදෙන විට **අනුක්ත කර්මය** ද්විතීයා විභක්තියෙන් යෙදේ.

  උදාහරණ :- **बालकः पुस्तकम् पठति ।** - ළමයා පොත පාඩම් කරයි.

- ඉහත වාක්‍යයේ **बालकः** යනු කර්තෘ ය. **पठति** යනු ක්‍රියාව යි. කර්තෘගේ එම ක්‍රියාවට යටත් ව ඇත්තේ **पुस्तकम्** යන්න යි. එය කර්මය වන අතර ද්විතීයාවෙන් යෙදී ඇත.

### 13.1 අභ්‍යාසය

**පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලයට නගන්න.**

१ नरः गृहं गच्छति ।

२ वृषभः तृणं खादति ।

३ अहम् ओदनं पचामि ।

४ वानराः वृक्षम् आरोहन्ति ।

५ सः जनकं नमति ।

६ जनकौ उदकम् आहरतः ।

७ वृषभः पर्णानि खादति ।

८ अलिः कुसुमं गच्छति ।

९ बालकः चित्रं पश्यति ।

१० बिडालः क्षीरं पिबति ।

## 13.2 අභ්‍යාසය

**පහත සඳහන් සිංහල වාක්‍ය සංස්කෘතයට නගන්න.**

1. මිනිසා නගරයට යයි.
2. මිනිස්සු දෙදෙන නගරයට යත්.
3. මිනිස්සු නගරවලට යත්.
4. ගොන්නු තණකොළ කත්.
5. වඳුරෝ ගෙඩි කත්.
6. වඳුරෝ දෙදෙන ගෙඩි දෙක කත්.
7. අලියා වනයට යයි.
8. කුරුල්ලා ගසට එයි.
9. මිනිස්සු උයනට යති.
10. බල්ලා ජලය බොයි.